**දඹුල්ල ප්‍රාදේශීය සභාව.**

**--------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**-----------------------**

.

**1 මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙන්ම ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ '' ගනුදෙනු මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්විමේ '' වාර්තාව 2014 දෙසැම්බර් 23 දින **දඹුල්ල** ප්‍රාදේශීය සභාවේ සභාවේ සභාපතිවරයාට යවාඇත

**1.2 ගනුදෙනු මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්වීම.**

**-------------------------------------------------------------------------**

**1.2.1 කළමණාකරන අකාර්යක්ෂමතා**

**--------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභාපතිවරයාට නිල වාහනයක් හා ඉන්ධන සීමා වෙන්කර තිබියදී ්ටඅමතරව 2013 ජූනි සිට සැප්තැම්බර් දක්වා රු.10,000 ක ඉන්ධන දීමනාවක් ද එකී කාලය තුළ නිල වාහනය සඳහා සභා අරමුදලින් ඉන්ධන සඳහා රු.70,902 ක්ද, සභාපතිවරයාගේ විවිධ ගමන් සඳහා යොදා ගත් කුලී වාහන සඳහා රු.93,000 ක් ද ගෙවා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ භාවිතය සඳහා යොදා ගන්නා වාහන 08 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාව සතු අංක 53 - 4734 දරන කැබ් රථය දැනට භාවිතා කිරීමට නුසුදුසු තත්ත්වයේ පවතින නමුත් එය අළුත්වැඩියා කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**1.2.2 කොන්ත්‍රාත් පරිපාලනය.**

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ

(අ) සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු.185,492 ක වියදමක් දරා විල්හත ප්‍රජා ශාලාවේ දැල් ගැසීම තිබුනු නමුත් ප්‍රජා ශාලාව භාවිතයට නොගන්නා බව ස්ථානීය පරීක්ෂාවේදී දක්නට ලැබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී සභා අරමුදලින් රු.102,500 ක් වියදම් දරා අල්ජලාලියා ගොවි සංවිධානය විසින් වැවල වෙලන්ගොල්ල ක්‍රීඩා පිටිය සකස් කර තිබුණි. එහෙත් පල්ලියට අයිත් ඉඩමේ අයිතිය නිරවුල් කරගෙන නොතිබුණු අතර පිට්ටනිය වල් බිහි විමනිසා ප්‍රයෝජනයට ගතනොහැකි තත්ත්වයක තිබූ බවත් ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මග නැගුම ප්‍රතිපාදන මත රු.500,000 ක වියදමක් දරා ලෙනදොර උතුර ග්‍රාම සංවර්ධන සමිතිය විසින් ලෙනදොර වෙන්දේසි වත්ත අදියර 02 මාර්ගයේ කුට්ටි ගල් අතුරා සංවර්ධනය කර තිබුණි. ඒ පිළිබඳව පරීක්ෂා කිරීමේදී කුට්ටි ගල් ඇතිරූ මාර්ගය ගිලා බැස තිබුණු බවත් කුට්ටි ගල් ඒකාකාර මට්ටමින් අල්ලා නොතිබුණු බවත් දක්නට ලැබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ සභා අරමුදලින් රු.146,541 ක වියදම් දරා පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය විසින් කළුන්දෑව පරණගම මහවැව පාර සංවර්ධනය කර තිබුණි.

- වැඩ විෂය අංක 01 යටතේ පැති කාණු කැපීම සඳහා රු.14,877 ක් ගෙවා තිබුණ නමුත් , වාර්තාවේ දැක්වෙන ගැඹුරට වඩා පැති කානුවල ගැඹුර අඩු බවද,

  ,-වැඩ විෂය අංක 02 යටතේ බොරළු සපයා ගැනීම වෙනුවෙන් රු.46,644 ක් ගෙවා තිබුණ නමුත් , නියමිත ප්‍රමිතියෙන් තොරව බොරළු අතුරා තිබුණු බවත්,

  ,- සාමාන්‍ය ප්‍රමාණයේ තිරිවානා ගල් කැට යොදා ඇති බවත්, ස්ථානීය පරීක්ෂාවේදී දක්නට ලැබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ දී සභා අරමුදලින් රු.200,000 ක වියදම් දරා එකමුතු ගොවි සංවිධානය විසින් දිගම්පතහ මාගල්ලෙන විහාරස්ථාන මාර්ගය සංවර්ධනය කර තිබුණි. මීටර් 1020 ක් දුරට කාණු කපා තිබුණත් මාර්ගයේ දෙපැත්තේම එක හා සමාන ලෙස කාණු කපා නොතිබුණු බව ස්ථානීය පරීක්ෂාවේදී දක්නට ලැබුණි.

(ඊ) 2013 වර්ෂයේ පළාත් මන්ත්‍රී ප්‍රතිපාදන මත රු.30,000 ක වියදමින් ස්ප්‍රේ යන්ත්‍රයක් හා වතුර පොම්පයක් සමන්තලායාය බෙදුම් ඇල ගොවි සංවිධානයට ලබා දී තිබුණි. සභාවේ ලේඛන අනුව 20 L පවර් ස්ප්‍රේ

(එල්.පී.එස් 777 වර්ගයේ) යන්ත්‍රයක් ලබා දී ඇති බව සඳහන් වුවද, සී ටෙක් ඇග්‍රෝ වර්ගයේ ස්ප්‍රේ යන්ත්‍රයක් ලබාදී ඇති බව භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(උ) සමාලෝචිත වර්ෂයේ මහ නැඟුම ව්‍යාපෘතිය යටතේ සභාවට ලැබී තිබූ ප්‍රතිපාදන මත බිම් ඇතුරුම් ගල් ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය සභාව විසින් කුට්ටිගල් සැපයීම ඇතුලු සියලු වැඩ විෂයයන් ඇතුලත් කර කොන්ත්‍රාත්කරුවන් සමග ගිවිසුම් ඇති කර ගෙන තිබුණි. එහෙත් ප්‍රාදේශීය සභාව විසින් කොන්ත්‍රාත්කරුවන්ට එම කර්මාන්ත වෙනුවෙන් සෘජුවම ගෙවීම් නොකර ගිවිසුම්ගත කොන්දේසි වලින් බැහැරව යමින් කුට්ටිගල් සැපයීම වෙනුවෙන් කොන්ත්‍රාත් 11 ක් සඳහා ඇතුගල හෝල්ඩින්ස් (පුද්) සමාගම වෙත රු.3,861,498 ක් ද, කොන්ත්‍රාත් 83 ක් සඳහා අරලිය ඉංජිනියරින්ස් (පුද්) සමාගම වෙත රු.26,136,000 ක් ද සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි

## 2 මෙහෙයුම් සමාලෝචනය

## 2.1 ඝන අපද්‍රව්‍ය කළමණාකරනය-

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දඹුල්ල 40 කණුව රක්ෂිතය, ඉනාමළුව, කිඹිස්ස සහ සීගිරිය යන ප්‍රදේශ වල දෛනිකව එකතු වන කසල සතියට දින දෙකක් එකතු කර එම කසල දිගම්පතහ තේක්ක රක්ෂිතයට අවිධිමත් ආකාරයෙන් බැහැර කරන බවත් පුස්තකාල භූමියේ ඉදිකර ඇති මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගෙන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය නොකරන බවත් නිරීක්ෂණය විය.

## 2.2 අයවැය පාලනය.

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුව මඟින් වැය විෂයයන් 04 ක් සඳහා ඇස්තමේන්තු කර තිබුණු රු.282,500 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) අයවැය ලේඛනය මගින් වරිපනම් හා බදු ආදායම් ශීර්ෂ යටතේ රු.255,000 ක ආදායම් උපයා ගැනීමට සැළසුම් කර තිබුණු නමුත්, ඉන් කිසිදු ආදායමක් උපයා ගැනීමට නොහැකි වී තිබුණි

**2.3 නොවිසිඳී ඇති හා පිළිතුරු නොලත් විගණන විමසුම්.**

**------------------------------------------------------------**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් වලින් විමසුම් 06 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගණනය කල හැකි ගනුදෙනු වල වටිනාකම රු.26,921,021 ක් විය.

**3. පද්ධති හා පාලන.**

**--------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(ආ) වත්කම් කලමනාකරණය

(ඇ) ආදායම් පරිපාලනය.

(ඉ) ඉන්වෙන්ට්‍රි පාලනය.

(ඊ) අයවැය පාලනය.